# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

# මාර්ගගත කෙටිකාලීන පාඨමාලා - 2023

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයන පීඨයේ ඉංග්‍රීසි අධ්‍යයනාංශය මඟින් පවත්වනු ලබන **Online Short Course on Academic Writing and Research Skills** සඳහා 2023 මැයි මස 25 දින දක්වා ලියාපදිංචි වීමට කැමති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**ඇතුළත් වීමේ සුදුසුකම්:**

- මෙම පාඨමාලාව හැදෑරීම සඳහා උනන්දුවක් දක්වන වයස අවුරුදු 16 සම්පූර්ණ ඕනෑම අයෙකුට මෙම පාඨමාලාවට ලියාපදිංචි විය හැක.

**පාඨමාලා කාලය:**

පාඨමාලා කාලය මාස 06 කි. සෑම සෙනසුරාදා දිනයකම ප.ව. 6.00 සිට 8.00 දක්වා මාර්ගගත දේශන පැවැත්වේ.

**මාධ්‍යය** - ඉංග්‍රීසි මාධ්‍යය

**ලියාපදිංචි ගාස්තුව : රු. 1000/- කි**

**පාඨමාලා ගාස්තු :**

මුළු ගාස්තුව රු. 10,000/- කි.
(එය ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුමට 711202 බැර කොට අදාළ රිසිට් පත අයදුම්පත සමඟ යොමු කළ යුතුය.)

**පාඨමාලා ආරම්භය හා ඉගැන්වීම් ක්‍රමවේදය:**

පාඨමාලාව 2023 ජුනි 03 දින ආරම්භ කරන අතර මාර්ගගත ක්‍රමයට විවිධ තාක්ෂණික මෙවලම් යොදාගනිමින් කණ්ඩායම් ක්‍රියාකාරකම්, ප්‍රස්තුතීකරණ, ශ්‍රව්‍ය හා දෘෂ්‍ය ආධාරක ආදිය ඇසුරින් ආකර්ෂණීය ලෙස දේශන පැවැත්වේ.

**අයදුම්පත් ලබා ගත හැකි ආකාරය:**

**වෙබ් අඩවිය මඟින්**

අයදුම්පත් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුවට (www.bpu.ac.lk ) පිවිස බාගත කර ගත හැකිය. දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202** දරණ ගිණුමට බැර වන පරිදි ලියාපදිංචි ගාස්තුව වන රු. 1000/- සහ පාඨමාලා ගාස්තුව වන රු. 10,000/- ක මුදල ගෙවා ලබා ගන්නා ලද ලදුපත අයදුම් පතට අමුණා එවිය යුතුය.

**තැපැල් මගින්**

තැපැල් මගින් අයදුම්පත් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි **රු. 1000/-** ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග නම, ලිපිනය ලියන ලද 9''x4'' ප්‍රමාණයේ රු. 45/-ක මුද්දර ඇලවූ කවරයක් පහත සඳහන් ලිපිනයට 2023.05.20 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. **චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.** අයදුම්පත් ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"Application form for Online Short Course on Academic Writing and Research Skills "** යනුවෙන් සඳහන් කළ යුතු ය.

අයදුම්පත් ලබා ගැනීමේ දී ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි රු.1000/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉදිරිපත් කිරීමෙන් හෝ විශ්වවිද්‍යාලයේ සරප් කවුළුවට රු.1000/-මුදල ගෙවීමෙන් ලබා ගන්නා ලද ලදුපත සමඟ ඉදිරිපත් කළ යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ ගෙවන ලද ලදුපත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2023.05.25 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ එවිය යුතුය.

සහකාර ලේඛකාධිකාරී
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2023.05.25 වේ. අයදුම්පත් තැපැල් මඟින් එවන්නේ නම් ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. **අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**දුරකථන අංක : 011-2580609 / 011-2502944**

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.
214 බෞද්ධාලෝක මාවත, කොළඹ 07
2023.04.26